# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2026 අංක 6 දරන ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 පෙබරවාරි මස 27 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 100.00

තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2026 අංක 6 දරන ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත**

[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 19 වන දින]

එල්.ඩී.-ඕ 4/2024

**ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය ප්‍රමිතීන් සහ විනය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා ද; ආයතනයේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා ද; තථ්‍ය දේපළ වෘත්තීය සම්බන්ධයෙන් වන ජනතාවගේ උනන්දුව ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

"ද ඉන්ස්ටිටියුට් ඔෆ් රියල් එස්ටේට් ඇන්ඩ් වැලුවේෂන්" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාංගමික සංස්ථා පත්‍රයට සහ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, එහි අරමුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ මෙතෙක් කල් ලියාපදිංචි කර තිබූ හෙයින් ද:

එකී ආයතනය සංස්ථාපනය කරනු ලැබුවේ යම් අරමුණු සහ කාරණා සඳහා ද, එම අරමුණු සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ මේ පනතේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා "ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය" යන නමින් පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද:

අමාත්‍ය මණ්ඩලයේ 2023 ඔක්තෝබර් මස 23 වන දිනැති තීරණය මගින් "ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය" පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතය ලබා දී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක 6 දරන ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

PL 15580 - 768 (2025/12)

ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම

**2.** (1) (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් ආයතනයට පවරා දී ඇති නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) ''ද ඉන්ස්ටිටියුට් ඔෆ් රියල් එස්ටේට් ඇන්ඩ් වැලුවේෂන්'' ආයතනයේ දැනට අධි සාමාජිකයන් වන සහ ආශ්‍රිත සාමාජිකයන් වන යම් හා යම් තාක් තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, මේ පනත මගින් සංස්ථාපනය කරනු ලබන ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කරගනු ලැබිය යුතු ය.

ආයතනයේ අරමුණු

**3.** ආයතනයේ අරමුණු -

(අ) ශ්‍රී ලංකාවේ තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ගරුත්වය සහ කීර්තිය නැංවීම සහ පවත්වාගෙන යාම;

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඉඩම් සහ දේපළ, ඒවායෙහි ඉහළ ම සහ විශිෂ්ට ම භාවිතය වෙත ගෙන ඒම සඳහා තථ්‍ය දේපළ ව්‍යාපෘති සැලසුම් කිරීමට, ආයෝජනය කිරීමට, සංවර්ධනය කිරීමට, කළමනාකරණය කිරීමට, අධීක්ෂණය කිරීමට, නිරීක්ෂණය කිරීමට, මිල කිරීමට සහ ඇගයීමට අදාළ සියලු කටයුතු සිදු කිරීම;

(ii) ඉඩම් සහ දේපළ සහ ඒවායෙහි හිමිකම් විකිණීම, මිල දී ගැනීම, අලෙවි කිරීම, තැරැව් කිරීම, වෙන්දේසි කිරීම, බද්දට දීම හෝ කුලියට දීම;

(iii) සියලු ආකාරයන්හි ඉඩම් සහ දේපළ, තිරවුරු, සවිකිරීම්, උපකරණ, පිරියත හා යන්ත්‍ර සහ ඒවායෙහි හිමිකම් සඳහා තථ්‍ය දේපළ සැලසුම්කරණය, ආයෝජනය, සංවර්ධනය කිරීම, වත්කම් කළමනාකරණය, මිල කිරීම සම්බන්ධ වෘත්තීය මතයක් සහ උපදේශක සේවාවන් අවශ්‍ය වන්නා වූ අවස්ථාවල දී රාජ්‍ය සහ පෞද්ගලික අංශයට, වෙනත් නියෝජ්‍යායතනයකට හෝ පුද්ගලයකුට එවැනි වෘත්තීය මතයක් සහ උපදේශන සේවාවන් සැපයීම සහ ඉහත සඳහන් කාරණාවල දී බේරුම්කරුවකු ලෙස ක්‍රියා කිරීම;

(iv) තථ්‍ය දේපළ ආයෝජන භාර පිහිටුවීම සහ කළමනාකරණය කිරීම සඳහා සහ තථ්‍ය දේපළ අනුයෝජිතත්වයෙහි සහ තැරැව්කරණ පරිචයන්හි නිරතව සිටින්නන් සඳහා වෘත්තීය සේවා සැපයීම;

(v) අදාළ ලිඛිත නීතියකට යටත්ව, පාරිසරික බලපෑම, ජලය සහ වාතය සම්බන්ධ අයිතිවාසිකම්, පතල් සහ ඛණිජ ද්‍රව්‍ය, ජීව විද්‍යාත්මක වත්කම් සහ උරුම දේපළ, තථ්‍ය දේපළ සැලසුම් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ දෘෂ්ටිකෝණයකින් ඇගයීම,

ඇතුළුව, ශ්‍රී ලංකාවේ තථ්‍ය දේපළ කර්මාන්තයට අදාළ වන ප්‍රතිපත්ති, ශිල්පීය ක්‍රම, ප්‍රමිතීන් සහ පරිචයන් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ඇ) රටේ සමාජ සහ ආර්ථික යහපැවැත්ම වෙනුවෙන් ඉඩම්වල සහ ආශ්‍රිත සම්පත්වල පරිසර හිතකාමී භාවිතය සුරක්ෂිත කිරීම;

(ඇ) ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම මත තථ්‍ය දේපළ වෘත්තිකයින් ඇතුළත් කර ගැනීම සහ ඔවුන් ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සැලසීම මඟින් තථ්‍ය දේපළ වෘත්තියේ ප්‍රමිතීන්, වෘත්තීයභාවය සහ කීර්තිය ඉහළ නංවා පවත්වාගෙන යාම සහ වෘත්තීයේ ප්‍රයෝජනවත් බව පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) වෘත්තීය සම්බන්ධයෙන් වන සාමාජිකයන්ගේ සම්බන්ධතා, තත්ත්වය, සුබසාධනය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද සහ මහජනතාවගේ උනන්දුව ඒකාබද්ධ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඊ) වඩාත් කාර්යක්ෂම ප්‍රතිපත්ති, තාක්ෂණික ක්‍රම, ප්‍රමිතීන් සහ පරිචයන් යොදා ගැනීම තහවුරු කිරීම පිණිස, (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තථ්‍ය දේපළ කර්තව්‍ය පිළිබඳ යාවත්කාලීන දැනුම සහ තොරතුරු ලබා ගැනීම සහ හුවමාරු කර ගැනීම සඳහා සහාය වීම;

(උ) අදාළ දත්ත බැංකු, තථ්‍ය දේපළ කර්මාන්තය සම්බන්ධයෙන් වන දේපළ සුචි, වත්කම් කළමනාකරණ මෙවළම් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සහ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවලට තථ්‍ය දේපළ වත්කම්වල යහභාවිතය සඳහා පහසුකම් සැලස්වීම පිණිස ඒ තොරතුරු ලබා දීම;

(ඌ) තථ්‍ය දේපළ සහ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඒවායෙහි ඇගයීම්වලට අදාළ කාරණා, කටයුතු සහ පරිචයන්හි නිරතව සිටින තැනැත්තන්ගේ හැකියාව තක්සේරු කිරීම පිණිස, ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම සහ ඒ හැකියාවන් පිළිබඳ සහතික පත්‍ර ප්‍රදානය කිරීම;

(එ) පර්යේෂණය සහ සංවර්ධනය සඳහා සහ වෘත්තීය සම්බන්ධතාවයක් සහිත ක්‍රියාකාරකම් පිළිබඳව වන පළ කිරීම් සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම මගින්,

නවෝත්පාදන සහ ඒ හා සම්බන්ධ සාකච්ඡා සැලකිල්ලට ගනිමින් තාක්ෂණික දැනුම අත්කර ගැනීමට සහ හුවමාරු කර ගැනීමට සහාය වීම; සහ

(ඒ) තථ්‍ය දේපළ සංවර්ධනය, කළමනාකරණය සහ ඇගයීම පිළිබඳ රජයේ හෝ පෞද්ගලික ආයතනවල සාමාජිකයන්ට හෝ ඒ පිළිබඳ කැමැත්තක් ඇති යම් පුද්ගලයකුට හැකියාවන් වර්ධනය කර ගැනීමේ පහසුකම් ලබා දීම,

විය යුතු ය.

**4.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනය වෙනුවෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු, කළ යුතු සහ ඉටු කළ යුතු පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ආයතනයට තිබිය යුතු ය:- ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

(අ) ආයතනයේ සාමාජිකත්වය සඳහා වන සුදුසුකම් සහ නුසුදුසුකම් සහ ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය චර්යාවන් පිළිබඳ ප්‍රමිතීන් නියම කිරීම සහ ඒවායෙහි පැවැත්ම සුරක්ෂිත කිරීම;

(ආ) ආයතනයේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම;

(ඇ) තථ්‍ය දේපළ කටයුතු පිළිබඳව ක්‍රියා කරන දේශීය සහ විදේශීය වෘත්තීය සංවිධාන සහ තථ්‍ය දේපළ කටයුතුවල නිරතව සිටින අධ්‍යාපනික සහ පර්යේෂණ ආයතන පිළිගැනීම;

(ඈ) ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, දේශීය හෝ විදේශීය යන දෙවර්ගයේ ම රාජ්‍ය සංවිධාන, සමාගම්, ආයතන හෝ තැනැත්තන් සමඟ ගිවිසුම් හෝ එකඟතාවයන්ට ඇතුළත් වීම සහ ඍජුව හෝ ආයතනය විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද යම් අනුයෝජිතයකු මගින් එකී ගිවිසුම් සහ එකඟතාවයන් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව ආයතනයේ කටයුතුවලට සමාන කටයුතුවල නියැලී සිටින වෙනත් තැනැත්තන් සහ සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම, ඒවාට සහාය දීම සහ ඒවායින් සහාය ලබා ගැනීම;

(ඊ) ආයතනයේ අරමුණු වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රී ලංකාවේ හෝ ඉන් බැහැර වෙනත් අදාළ ආයතන සමඟ අනුබද්ධව සහ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු පවත්වාගෙන යාම;

(උ) ආයතනයේ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබා දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම සහ හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඌ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව සිටින පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන මුදල් හෝ ද්‍රව්‍යමය ආකාරයෙන් වන ප්‍රදාන, ත්‍යාග, ආධාර, සහනාධාර, පරිත්‍යාග සහ දායක මුදල් ලබා ගැනීම;

(එ) ආයතනයේ සාමාජිකත්වය, සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සහ ආයතන විසින් පවත්වන අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් වන ගාස්තු, සාමාජික මුදල් සහ දායක මුදල් අය කිරීම;

(ඒ) සභාව විසින් අනුමත කළ හැකි පරිදි, යම් රාජ්‍ය බැංකුවක බැංකු ගිණුම්, ඉතිරි කිරීම්, තැන්පතු සහ සුරැකුම් විවෘත කොට පවත්වාගෙන යාම;

(ඔ) සභාව විසින් කලින් කලට රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි, ඇපයක් සහිතව හෝ රහිතව, යම් නියම සහ කොන්දේසි මත, ආයතනයේ කාර්යය සඳහා මුදල් අත්තිකාරකම් ලබා ගැනීම, ණයට දීම හෝ ණයට ලබා ගැනීම;

(ඕ) ආයතනයේ අරමුණු වෙනුවෙන් ඉක්මනින් අවශ්‍ය නොවන ආයතනයේ අරමුදල්, සභාවේ අනුමතය ඇතිව, ආයතනයේ අරමුණු වැඩිදියුණු කිරීම වෙනුවෙන් අවශ්‍ය විය හැකි පරිදි හෝ යෝග්‍ය විය හැකි පරිදි වූ යම් ආකාරයකින් ආයෝජනය කිරීම;

(ක) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි හෝ පැවරිය හැකි සාධනපත්‍ර හෝ සුරැකුම්පත් සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, මිල දී ගැනීම, විකිණීම හෝ නිකුත් කිරීම; සහ

(ග) ආයතනයේ අරමුණු ක්‍රියාත්මක කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ ඊට ආනුෂංගික නැතහොත් ඊට උපකාරී වන, එවැනි වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

ආයතනයේ සාමාජිකයන් සහ සාමාජිකත්වය ශ්‍රේණිගත කිරීම

**5.** (1) ආයතනයේ සාමාජිකයන්, සංස්ථාගත සාමාජිකයන්ගෙන් සහ සංස්ථාගත නොවන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) (අ) ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්, අධි සාමාජිකයන් හෝ සාමාජිකයන් ලෙස ශ්‍රේණිගත කළ යුතු ය.

(ආ) ආයතනයේ සංස්ථාගත නොවන සාමාජිකයන්, ආශ්‍රිත සාමාජිකයන්, ශිෂ්‍ය සාමාජිකයන් සහ ගරු සාමාජිකයන් ලෙස ශ්‍රේණිගත කළ යුතු ය.

(3) 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එක් එක් ශ්‍රේණිවල සාමාජිකත්වය සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සහ පළපුරුද්ද, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි විය යුතු ය.

(4) සෑම සංස්ථාගත සාමාජිකයකු ම, ඡන්දය ලබා දීමට සහ ආයතනයේ සභාවට හෝ යම් කමිටුවකට තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු අතර ආයතනයේ සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(5) සෑම සංස්ථාගත නොවන සාමාජිකයකු ම, කැඳවීම මගින්, ආයතනයේ රැස්වීම්වලට සහභාගී වීමට හිමිකම් ලැබිය යුතු නමුත් ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය නොතිබිය යුතු ය.

ආයතනයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීම

**6.** (1) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති යම් තැනැත්තකුට, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකෘතියකට සහ ආකාරයකට අනුව, ආයතනයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන තැනැත්තකු, රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සාමාජික ගාස්තුව ගෙවීමෙන් පසුව සහ සභාවේ අනුමතයට යටත්ව, ආයතනයේ සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම කරනු ලැබිය හැකි ය.

සාමාජිකත්ව කාලසීමාව සහ සාමාජිකත්වය අලුත් කිරීම

**7.** (1) 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සාමාජිකයකුගේ සාමාජිකත්ව කාලසීමාව, ලිත් වර්ෂයක් විය යුතු අතර එය අලුත් කරනු ලැබිය යුතු ය.

(2) සාමාජිකත්වය අලුත් කිරීමට අදහස් කරනු ලබන යම් සාමාජිකයකු විසින්, සාමාජිකත්ව කාලසීමාව ඉකුත් වීමට දින තිහකට නොඅඩු කාලසීමාවකට පෙරාතුව, සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අලුත් කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසු, සාමාජිකත්වය අලුත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයකු වීමට නුසුදුසුකම්, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම, විනය පිළිබඳ බලතල සහ කාර්යපටිපාටිය

**8.** (1) යම් තැනැත්තකු -

(අ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට අනාවරණය කරගනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ආ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් බුන්වත් පුද්ගලයකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම් හෝ බුන්වත්භාවයට පත්ව ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් විඳිනු ලැබ ඇති හෝ විඳිමින් සිටින අයකු වේ නම්;

(ඈ) සභාව විසින් හෝ 18 වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, වෘත්තීය විෂමාචාරයකට වරදකරු බවට අනාවරණය කරගනු ලැබ ඇත්නම්,

ඒ තැනැත්තා සභාවේ හෝ ආයතනයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ සභාවේ හෝ ආයතනයේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(2) ආයතනයේ සාමාජිකයකු වන යම් තැනැත්තකු, (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් නුසුදුසුකමකට යටත් වන්නේ නම්, ඒ තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට සහ ඒ තැනැත්තාගේ ලියාපදිංචිය අවලංගු කිරීමට සභාවට බලය තිබිය යුතු ය:

එසේ වුව ද, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම වෙනුවට, සභාව විසින් සුදුසු යයි තීරණය කළ හැකි යම් කාලසීමාවක් සඳහා ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, ඒ තැනැත්තා නැවත සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීමට සහ නැවත ලියාපදිංචි කිරීමට සුදුසු බවට සභාව විසින් සෑහීමට පත්වන්නේ නම්, ඒ තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කිරීමේ සහ ලියාපදිංචිය අවලංගු කිරීමේ හේතුව මඟින්, ඔහුව සභාව විසින් පසුව නැවත සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සහ නැවත ලියාපදිංචි කිරීම වළක්වනු නොලැබිය යුතු ය.

(3) 18 වන වගන්තිය යටතේ සභාව විසින් පත් කරන ලද විනය කමිටුවක් විසින්, පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, (1) වන උපවගන්තිය යටතේ සභාවේ සාමාජිකයකු වීමට ඒ සාමාජිකයා

නුසුදුසු වී ඇති බවට සහ ඒ සාමාජිකයා වෘත්තීය විෂමාචාරයක් සිදු කර ඇති බවට සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස, ආයතනයේ කිසිදු සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවීම නොකළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබ සහ ලියාපදිංචිය අවලංගු කරනු ලැබ හෝ සාමාජිකත්වය අත්හිටුවනු ලැබ ඇති යම් තැනැත්තකුට, යළි සාමාජිකත්වයේ පිහිටුවීම සඳහා ඉල්ලුම් කළ හැකි අතර, සභාව විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි පරිදි වන යම් නියම සහ කොන්දේසි මත ඒ තැනැත්තා යළි සාමාජිකත්වයේ පිහිටුවනු ලැබිය හැකි ය.

ආයතනයේ නාමය භාවිත කිරීම

**9.** (1) ආයතනයේ යම් සංස්ථාගත සාමාජිකයකුට ''ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනයේ සාමාජික'' යන නාමය ගැනීමට සහ භාවිත කිරීමට සහ ඔහු ආයතනයේ අධි සාමාජිකයකු බව පෙන්නුම් කිරීම සඳහා ඔහුගේ නමට පසුව ''එෆ්.අයි.ආර්.ඊ.පී. එස්.එල්'' යන කෙටි යෙදුම භාවිත කිරීමට සහ ඔහු ආයතනයේ සාමාජිකයකු බව පෙන්නුම් කිරීම සඳහා ඔහුගේ නමට පසුව ''එම්. අයි.ආර්.ඊ.පී.එස්.එල්'' යන කෙටි යෙදුම භාවිත කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති නාමවලට අමතරව, සංස්ථාගත සාමාජිකයකුට, ඔහුගේ යෝග්‍යතාවය, කාර්යසාධනය සහ කුසලතාවය මත පදනම්ව, 18 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජික කමිටුවේ ඇගයීමකින් පසුව සහ ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමතයට යටත්ව, ''වරලත් තථ්‍ය දේපළ වෘත්තිකයා'' යන පදවි නාමය, ඒ සංස්ථාගත සාමාජිකයාට ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි වන යම් නියමයන්ට යටත්ව, තථ්‍ය දේපළ සංවර්ධනය සහ කළමනාකරණ වෘත්තීය කරගෙන යන යම් ව්‍යාපාර ආයතනයක් විසින්, ආයතනයේ සාමාජිකත්වය ප්‍රදානය කරනු ලැබීම සඳහා සලකා බලන ලෙසට ආයතනයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ආයතනයේ සාමාජිකත්වය ඉල්ලා සිටින ව්‍යාපාර ආයතනයට, තථ්‍ය දේපළ පිළිබඳ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට නීතිමය අයිතිවාසිකම් පැවතිය යුතු අතර, අවම වශයෙන් සංස්ථාගත සාමාජිකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන් වශයෙන් සිටිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක්, 18 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජික කමිටුව විසින් සලකා බලනු ලැබිය හැකි අතර එහි නිර්දේශ ද සමග ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් වන අවස්ථාවක දී, සභාව විසින්, ඒ ව්‍යාපාර ආයතනයේ නිල නාමයේ කොටසක් ලෙස "වරලත් තථ්‍ය දේපළ වෘත්තිකයා" යන ප්‍රධාන නාමය ලබා ගැනීමට සහ භාවිත කිරීමට ඒ ව්‍යාපාර ආයතනයට අවසර දෙනු ලැබිය හැකි ය.

(6) ඉහත කී ආකාරයට හැර, කිසිදු තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් උපදේශන ආයතනයක් වශයෙන්, අවස්ථාවෝචිත පරිදි, "වරලත් තථ්‍ය දේපළ වෘත්තිකයා" යන නාමය, "එෆ්.අයි.ආර්.ඊ.පී.එස්.එල්" හෝ "එම්.අයි.ආර්.ඊ.පී.එස්.එල්" යන කෙටි යෙදුම් ගැනීම හෝ භාවිත කිරීම හෝ එම නාමය හෝ කෙටි යෙදුම්, තථ්‍ය දේපළ වෘත්තීය හා සම්බන්ධ පොතක, සඟරාවක හෝ වෙනත් යම් ප්‍රකාශනයක තම නාමය හෝ නාමයෙහි කොටසක් ලෙස භාවිත කිරීම නොකළ යුතු ය.

(7) ආයතනය විසින් පිරිනමා ඇත්නම් මිස, කිසිදු සාමාජිකයකු විසින්, (1) වන උපවගන්තියේ සඳහන් කළ යම් නාමයක් හෝ කෙටි යෙදුමක් ගැනීම හෝ භාවිත කිරීම සිදු නොකළ යුතු ය.

සාමාජිකයන්ගේ රෙජිස්ටරය

**10.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකුගේ ම විස්තර සහ ආයතනයේ සාමාජිකයකු ලෙස මින් මතු නිසි ආකාරයෙන් ඇතුළත් කර ගනු ලබන සෑම

තැනැත්තකුගේ ම විස්තර ඇතුළත් විය යුතු සාමාජිකයන්ගේ රෙජිස්ටරයක්, ආයතනය විසින් තබාගත යුතු අතර එය පවත්වාගෙන යා යුතු ය.

(2) සාමාජිකයන්ගේ රෙජිස්ටරය, වෙන් වෙන් වශයෙන් වූ කොටස්වලට බෙදා දැක්විය යුතු අතර, ඒ එක් එක් කොටසක්, රෙජිස්ටරය අදාළ වන විවිධ ශ්‍රේණිවල සාමාජිකයන් සම්බන්ධයෙන් විය යුතු අතර, ඒ ඒ ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලද සහ ලියාපදිංචි කරන ලද තැනැත්තන්ගේ නම්, ලිපින, ඔවුන් සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර සහ සුදුසුකම් සහ පළපුරුද්ද එහි ඇතුළත් විය යුතු ය.

ආයතනයේ සභාව

**11.** (1) 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා සහ ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය සඳහා වගකිව යුතු (මේ පනතේ “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ සභාවක් පැවතිය යුතු ය.

(2) සභාව, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සංස්ථාගත සාමාජිකයන් විසින් ඔවුන් අතරින් තෝරා පත් කර ගනු ලැබිය යුතු සභාවේ සභාපතිවරයා, උපසභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරික සහ සහකාර ලේකම්වරයා:

එසේ වුව ද, සභාපතිවරයා සහ උපසභාපතිවරයා ආයතනයේ අධි සාමාජිකයන් විය යුතු ය;

(ආ) පෙරාතුව ම වූ වර්ෂයේ සභාවේ සභාපති ධුරය දරන ලද තැනැත්තා; සහ

(ඇ) ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමක දී සංස්ථාගත සාමාජික කාණ්ඩය නියෝජනය කරන සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් හත්දෙනකු.

(3) ආයතනයේ පළමු සභාව, මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සභාවේ ධුරය දරනු ලබන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය

**12.** (1) සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු විසින් කලින් ධුරය හිස් කරනු ලබන්නේ නම් හෝ සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සභාව සඳහා අලුත් සාමාජිකයන් තෝරා පත් කර ගන්නා තෙක් වසර එකක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, අනුක්‍රමික ධුර කාල දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(2) සභාවේ සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් හේතුවක් මත ධුරය හිස්කරනු ලබන අවස්ථාවක දී, 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීම සඳහා ආයතනයේ වෙනත් යම් සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) සභාවේ සාමාජිකයකු, 18 වන වගන්තිය යටතේ පත් කරනු ලබන විනය කමිටුව විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවකින් පසුව, ආයතනයේ සාමාජිකයකු වීමට 8 වන වගන්තිය යටතේ නුසුදුසු භාවයට පත්ව ඇත්නම්, සභාව විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) සභාවේ සෑම සාමාජිකයකු විසින් ම-

(අ) සභාව අමතා යවනු ලබන ලිපියක් මගින් ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් පසුව සහ ඒ ඉල්ලා අස්වීම සභාව විසින් පිළිගැනීමෙන් පසුව;

(ආ) සභාවේ අවසරයකින් තොරව, සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට සහභාගී නොවීම මත;

(ඇ) ආයතනයේ සාමාජිකයකුව සිටීම අවසන් වීම මත; සහ

(ඇ) 8 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද යම් හේතුවක් මත ඒ සාමාජිකයා සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ සාමාජිකත්වය අත්හිටුවීම මත,

ධුරය හිස් කරනු ලැබිය යුතු ය.

(5) ධුරය හිස් කරන ලද සාමාජිකයකු වෙනුවට කටයුතු කිරීමට පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු විසින් ම, ඔහු කලින් ඉල්ලා අස්වීම, මියයාම හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාල සීමාව සඳහා ඔහු විසින් ධුරය දරනු ලැබිය යුතු ය.

සභාවේ රැස්වීම්

**13.** (1) සභාවේ රැස්වීම් අවම වශයෙන් සෑම මසකට ම එක් වරක්වත් පැවැත්විය යුතු ය.

(2) සභාවේ යම් රැස්වීමක ගණපූරණය, සභාවේ සාමාජිකයන් හත්දෙනකු විය යුතු ය.

(3) සභාවේ සභාපතිවරයා විසින් සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී උපසභාපතිවරයා හෝ, සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනා ම පැමිණ නොමැති අවස්ථාවක දී ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු විසින්, සභාවේ ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(4) (අ) සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව ම වන දැන්වීම, ඒ රැස්වීම සඳහා නියම කරනු ලැබ ඇති දිනයට දින හතකට පෙරාතුව සභාවේ සෑම සාමාජිකයකුට ම ලිඛිතව ලබා දිය යුතු ය.

(ආ) ඒ දැන්වීම, -

(i) ඒ රැස්වීම පවත්වන දිනය, වේලාව සහ ස්ථානය සහ රැස්වීමේ දී මතු කිරීමට

බලාපොරොත්තු වන කටයුතු ඇතුළත් දැන්වීමක් විය යුතු ය; සහ

(ii) එක් එක් සාමාජිකයාගේ අවසානයට දැන සිටි පදිංචිව සිටින ලිපිනය වෙත තැපැල් මගින් හෝ ඒ එක් එක් සාමාජිකයා වෙත විද්‍යුත් තැපැල මගින් යවනු ලැබිය යුතු ය.

(5) සභාවේ යම් රැස්වීමක මුලසුන දරනු ලබන තැනැත්තා විසින්, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත රැස්වීම කල් තැබීම සිදු කරනු ලැබිය හැකි ය.

(6) (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, සභාවේ යම් රැස්වීමක දී පැන නගින යම් ප්‍රශ්නයක්, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු අතර, ඡන්ද සමාන වන අවස්ථාවක දී, රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(7) ආයතනයේ සාමාජිකයකු, සභාවේ ධුරය දරනු ලබන මුළු සාමාජිකයන්ගෙන් බහුතරයක් විසින් සභාවේ රැස්වීමක දී සම්මත කරගනු ලබන යෝජනා සම්මතයකින් පසුව මිස, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ ඒ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවීම කරනු නොලැබිය යුතු ය.

(8) සභාව විසින්, තත්කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන පොත්වල, සභාවේ සෑම රැස්වීමක ම කටයුතු පිළිබඳ රැස්වීම් සටහන් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳ රැස්වීම් සටහන් ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(9) එසේ අත්සන් කරන ලද රැස්වීම් සටහන්, ඒ රැස්වීම් සටහන්වල නිශ්චිතව සඳහන් කර ඇති කාරණා සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(10) සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක්, සභාවේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු ය.

(11) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, සභාව විසින්, සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

සභාවේ විශේෂ රැස්වීම

**14.** සභාවේ විශේෂ රැස්වීමක්, සභාපතිවරයා විසින්, ස්වකීය යෝජනාවක් මත හෝ සභාවේ මුළු සාමාජිකයන්ගෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් මගින් තත්කාර්යය සඳහා ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත කැඳවනු ලැබිය හැකි ය.

සභාවේ සභාපතිවරයා

**15.** සභාවේ සභාපතිවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. ඔහු විසින් සභාවේ සහ ආයතනයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. ඔහු විසින් ඔහුගේ යම් කාර්ය සහ කර්තව්‍යය උපසභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

සභාවේ ලේකම්වරයා

**16.** (1) සභාවේ ලේකම්වරයා විසින්-

(අ) ආයතනය වෙනුවෙන් සියලු ලිපි ගනුදෙනු සිදු කිරීම;

(ආ) සභාවේ සහ ආයතනයේ සියලු රැස්වීම්වල රැස්වීම් සටහන් පවත්වාගෙන යාම;

(ඇ) සභාවේ සහ ආයතනයේ රැස්වීම් පිළිබඳ දැන්වීම් යැවීම;

(ඈ) සභාවේ වාර්ෂික වාර්තා සකස් කිරීම;

(ඉ) ආයතනයේ වත්කම් සහ ආයතනයේ සාමාජිකයන්ගේ රෙජිස්ටරය පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම; සහ

(ඊ) සභාව විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි එවැනි වෙනත් සියලු කාර්ය ඉටු කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) සභාවේ ලේකම්වරයා විසින්, ඔහුගේ යම් කාර්ය සහ කර්තව්‍ය, සහකාර ලේකම්වරයා වෙත හෝ සභාව විසින් නම් කරනු ලබන සභාවේ වෙනත් යම් සාමාජිකයකු වෙත පවරනු ලැබිය හැකි ය.

**17.** සභාවේ භාණ්ඩාගාරික විසින් - සභාවේ භාණ්ඩාගාරික

(අ) ආයතනය වෙත ලැබිය යුතු අරමුදල් රැස්කිරීම සඳහා වගකිව යුතු ය;

(ආ) ආයතනයේ මුදල් පිළිබඳ නිවැරදි ගිණුම් තබා ගත යුතු ය; සහ

(ඇ) ආයතනයේ මූල්‍ය ප්‍රකාශය සකස් කිරීම සඳහා සහ සභාව විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි ආයතනයේ මූල්‍ය කටයුතුවලට අදාළ එවැනි වෙනත් කාර්ය ඉටු කිරීම සඳහා ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ මාසික ප්‍රකාශයක් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

**18.** (1) සභාව විසින්, කලින් කලට, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාර්යයක් සඳහා කමිටු පත් කරනු ලැබිය හැකි අතර, ඒ එක් එක් කමිටුවලට ඒවායේ කාර්ය සහ කර්තව්‍ය පවරනු ලැබිය යුතු ය. තව ද ඒ කමිටුවල පහත දැක්වෙන කමිටු ඇතුළත් විය යුතු ය:- සභාවේ කමිටු

(අ) සාමාජික කමිටුව;

(ආ) ප්‍රතිපත්ති උපදේශක සහ ව්‍යවස්ථා කමිටුව;

(ඇ) වෘත්තීය චර්යාව සහ පරිචය පිළිබඳ කමිටුව;

(ඈ) වෘත්තීය සංවර්ධනය සහ ප්‍රකාශන පිළිබඳ කමිටුව;

(ඉ) විනය කමිටුව; සහ

(ඊ) සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි පරිදි වන වෙනත් යම් කාර්යයක් සඳහා වූ වෙනත් යම් කමිටුවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සෑම කමිටුවක් ම අවම වශයෙන් සභාවේ එක් සාමාජිකයකුගෙන්වත් සමන්විත විය යුතු අතර, ඒ සාමාජිකයා කමිටුවේ සභාපතිවරයා විය යුතු ය:

එසේ වුව ද, ආයතනයේ සභාපතිවරයා, (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් කරන ලද කමිටුවල සභාපතිවරයා විය යුතු ය.

(3) සභාවේ එක් සාමාජිකයකුට වඩා වැඩි සංඛ්‍යාවක් යම් කමිටුවකට පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, සභාව විසින් ඒ සාමාජිකයන්ගෙන් එක් අයකු ඒ කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) එක් එක් කමිටුවේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි විය යුතු ය.

(5) සභාපතිවරයා විසින්, තමා සාමාජිකයකු වන්නා වූ කමිටුවක සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් තැනැත්තකු සභාපතිවරයා ලෙස ඒ රැස්වීමේ මුලසුන දැරීමට තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(6) සභාව විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයකට යටත්ව, කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි යම් ආකාරයකින් කමිටුවේ කටයුතු සිදු කිරීම සහ එහි කාර්යපටිපාටිය විධිමත් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

සභාවේ බලතල පැවරීම

**19.** (1) සභාව විසින්, ලිඛිතව සහ එහි නිශ්චිතව සඳහන් කර ඇති යම් කොන්දේසිවලට යටත් ව, සභාවේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සභාපතිවරයාට හෝ ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු වෙත පවරනු ලැබිය හැකි අතර, සභාපතිවරයා හෝ ඒ වෙනත් යම් නිලධරයා හෝ සේවානියුක්තයා විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය සභාවේ නමින් සහ ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කළ යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, සභාව විසින්, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සිදු කරනු ලැබිය හැකි අතර ඕනෑම වේලාවක එවැනි යම් පැවරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

ආයතනයේ මුද්‍රාව

**20.** (1) ආයතනයේ මුද්‍රාව සභාව භාරයේ තිබිය යුතු අතර සභාවෙන් කලින් ලබා ගත් අවසරය මත සහ ලිඛිතව බලය දෙනු ලැබිය හැකි සහ ඔවුන් පැමිණ ඇති බවට සලකුණක් වශයෙන් ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු සභාවේ ලේකම්වරයා සහ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිදු ලියවිල්ලකට ආයතනයේ මුද්‍රාව නොතැබිය යුතු අතර ඒ අත්සන් කිරීම, යම් පුද්ගලයකු සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් කිරීමෙන් ස්වාධීන විය යුතු ය.

(2) ආයතනය විසින්, ආයතනයේ මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර සහ ලේඛනවල රෙජිස්ටරයක් තබා ගැනීම සහ පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීම

**21.** (1) ආයතනයේ මහා සභා රැස්වීම වාර්ෂිකව පවත්වනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ ගණපූරණය ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්ගෙන් පහෙන් දෙකක් විය යුතු ය.

(3) ආයතනයේ එවැනි මහා සභා රැස්වීමක දී -

(අ) සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම;

(ආ) පෙරාතුව ම වූ මූල්‍ය වර්ෂය සඳහා සභාවේ වාර්ෂික වාර්තා සහ විගණනය කළ ගිණුම්, සාමාජිකයන්ගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම;

(ඇ) සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් කටයුත්තක් හෝ සභාවේ සාමාජිකයන් හත් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින්, වාර්ෂික මහා සභා රැස්වීමේ දී සාකච්ඡා කිරීම සඳහා සභාවේ අවධානය පිණිස ලිඛිතව යොමු කරනු ලබන යම් කාරණාවක් සාකච්ඡා කිරීම; සහ

(ඈ) ආයතනයේ අභ්‍යන්තර විගණකවරු පත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

(4) (අ) වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම, ඒ රැස්වීම සඳහා නියම කරනු ලැබ ඇති දිනයට මාසයකට පෙරාතුව ආයතනයේ සෑම සාමාජිකයකුට ම ලිඛිතව ලබා දිය යුතු අතර, ඒ දැන්වීමෙහි ඒ රැස්වීම පවත්වන දිනය, වේලාව සහ ස්ථානය සහ රැස්වීමේ දී සලකා බැලීමට නියමිත කටයුතු ඇතුළත් විය යුතු ය.

(ආ) ඒ දැන්වීම එක් එක් සාමාජිකයාගේ පදිංචි ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට යවනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම සඳහා නියම කරනු ලැබ ඇති දිනයට සති දෙකකට වඩා පසු නොවන කාලසීමාවකට පෙරාතුව ශ්‍රී ලංකාවේ පුළුල් වශයෙන් බෙදාහරිනු ලබන දිනපතා පුවත්පතක පළ කරනු ලැබිය යුතු ය.

(5) මහා සභා රැස්වීමක දී සාකච්ඡාවට භාජනය කරනු ලබන යම් කාරණාවක් සම්බන්ධයෙන් හෝ එහි දී ගැනීමට නියමිත යම් තීරණයක් සම්බන්ධයෙන් මෙන් ම, සභාවේ සාමාජිකයන් තෝරා පත් කරගනු ලබන අවස්ථාවේ දී තම ඡන්දය ප්‍රකාශ කිරීමට සංස්ථාගත සාමාජිකයන් සුදුසුකම් ලැබිය යුතු ය.

(6) සංස්ථාගත නොවන සාමාජිකයන්, වාර්ෂික මහා සභා රැස්වීමට පැමිණීමට සහ සහභාගීවීමට හිමිකම් ලැබිය යුතු නමුත් වාර්ෂික මහා සභා රැස්වීමක දී සාකච්ඡාවට භාජනය කරනු ලබන යම් කාරණාවක් සම්බන්ධයෙන් හෝ එහි දී ගැනීමට නියමිත යම් තීරණයක් සම්බන්ධයෙන් මෙන් ම, සභාවේ සාමාජිකයන් තෝරා පත් කරගන්නා අවස්ථාවේ දී තම ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

**22.** (1) ආයතනයේ විශේෂ මහා සභා රැස්වීමක්, සභාවේ පූර්ව අනුමතය ඇතිව විශේෂ කාර්යයක් සඳහා පවත්වනු ලැබිය යුතු ය.

ආයතනයේ විශේෂ මහා සභා රැස්වීම

(2) විශේෂ මහා සභා රැස්වීමක ගණපූරණය, ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබන ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්ගෙන් පහෙන් දෙකක් විය යුතු ය.

(3) (අ) විශේෂ මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීමක්, රැස්වීම සඳහා නියම කරනු ලැබ ඇති දිනට සති දෙකකට පෙරාතුව ආයතනයේ සෑම සාමාජිකයකුට ම ලිඛිතව ලබා දිය යුතු අතර, ඒ දැන්වීමෙහි ඒ රැස්වීම පවත්වන දිනය, වේලාව, ස්ථානය සහ රැස්වීමේ දී සලකා බැලීමට නියමිත විශේෂිත කාරණය ද ඇතුළත් විය යුතු ය.

(ආ) ඒ දැන්වීම, තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල මගින් එක් එක් සාමාජිකයාගේ අවසන් වතාවට පදිංචිව සිටි බවට දන්නා ලිපිනයට සහ විද්‍යුත් තැපැල් ලිපිනයට යවනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම සඳහා නියම කරනු ලැබ ඇති දිනයට සතියකට වඩා පසු නොවන කාලසීමාවකට පෙරාතුව ශ්‍රී ලංකාවේ පුළුල් වශයෙන් බෙදාහරිනු ලබන දිනපතා පුවත්පතක පළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ආයතනයේ එක් එක් සාමාජිකයා වෙත යවනු ලබන දැන්වීමේ සඳහන් කරුණු හැර අන් කිසිවක්, ඒ දැන්වීම අදාළ වන්නා වූ විශේෂ මහා සභා රැස්වීමේ දී සලකා බැලීම කරනු නොලැබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය

**23.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනය විසින් එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවානියුක්තයන් ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි සේවයේ යෙදවීම හෝ එයට පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාවට -

(අ) ආයතනයේ නිලධරයන් සහ සේවානියුක්තයන්ගේ විනය පාලනය සහ ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට;

(ආ) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීමට; සහ

(ඇ) ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය නියම කිරීමට,

බලය තිබිය යුතු ය.

(3) ආයතනයේ සියලු ම සේවානියුක්තයන්, සේවානියුක්තියට අදාළ රාජකාරි ආරම්භ කිරීමෙන් මාසයක් ඇතුළත, ඔවුන්ගේ සමීප ඥාතීන්ට ආයතනයේ කාර්ය සහ කටයුතුවලට ඇති ඍජු හෝ වක්‍ර පෞද්ගලික සම්බන්ධතා ද ඇතුළුව ඒ සේවානියුක්තයාට ආයතනයේ කාර්ය සහ කටයුතුවලට ඇති ඍජු හෝ වක්‍ර පෞද්ගලික සම්බන්ධතා හෝ ඒ සේවානියුක්තයන්ට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති යම් කාරණයක් පිළිබඳව ආයතනය වෙත ලිඛිතව ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

ආයතනයේ අරමුදල

**24.** (1) ආයතනයට (මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) අරමුදලට -

(අ) මේ පනත යටතේ ආයතනය විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී

සහ ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල්; සහ

(ආ) ආදායම්, ගාස්තු, අයකිරීම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර කවරාකාරයෙන් හෝ යම් මූලාශ්‍රයකින් ආයතනයට ලැබෙන සියලු මුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) අරමුදලින් -

(අ) ආයතනය විසින්, මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය විය හැකි සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

**25.** (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය. ගිණුම් විගණනය

(2) ආයතනය විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ ආයතනයේ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) ආයතනයේ ගිණුම්, වාර්ෂිකව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු අතර, ඒ සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත්

යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තකු; හෝ

(ආ) එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, වරලත් ගණකාධිකාරී ව්‍යාපාර ආයතනයක්,

අදහස් වේ.

දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව

**26.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

වෘත්තීය චර්යා සංග්‍රහය

**27.** (1) ආයතනයේ සාමාජිකයන්ට අදාළ වන වෘත්තීය චර්යා සංග්‍රහය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට එක් වසරක කාලසීමාවක් ඇතුළත මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) වෘත්තීය චර්යා සංග්‍රහයේ නිශ්චිතව සඳහන් කර ඇති වෘත්තීය ප්‍රමිතීන් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් සාමාජිකයකු, විනය පරීක්ෂණයකට යටත් විය යුතු අතර, 8 වන වගන්තිය යටතේ සාමාජිකත්වය සඳහා නුසුදුස්සකු විය හැකි ය.

ආයතනයේ රීති

**28.** (1) සභාව විසින්, ආයතනයේ යම් වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී සහ පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරනු ලබන සාමාජිකයින් බහුතරයක් මගින් මේ පනත මගින් රීති සෑදිය යුතු යයි බලය දී ඇති හෝ නියම කර

ඇති යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් කලින් කලට රීති සාදනු ලැබිය හැකි ය. එවැනි රීති, සාදනු ලැබූ විට, එවැනි ම රැස්වීමක දී, එවැනි ම ආකාරයෙන් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාව වෙත පවරන ලද බලතලවලට අගතියක් නොමැතිව, සභාව විසින්, පහත දැක්වෙන යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එක් එක් සාමාජික ශ්‍රේණිය සඳහා ගෙවිය යුතු ගාස්තු සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීමේ දී, සාමාජිකත්වය උසස් කිරීමේ දී, සාමාජිකත්වයෙන් ඉවත් වීමේ දී, සාමාජිකත්වය අත්හිටුවීමේ දී, සාමාජිකත්වයෙන් නෙරපා හැරීමේ දී හෝ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය;

(ආ) විනය කාර්යයපටිපාටිය, පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සහ වෘත්තීය චර්යා සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල වීම;

(ඇ) ආයතනයේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුන්ගේ පත් කිරීම්, පාරිශ්‍රමික, ධුරය අවසන් කිරීම පිළිබඳව සහ ආයතනයේ සහ සභාවේ සහ එහි යම් කමිටුවක රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යන ආකාරය ද ඇතුළුව එවැනි රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී පිළිපැදිය යුතු කාර්යපටිපාටිය;

(ඈ) ආයතනයේ සංස්ථාගත සහ සංස්ථාගත නොවන සාමාජිකයන් සහ විවිධ ශ්‍රේණිවලට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු යයි සලකනු ලබන සුදුසුකම්, නුසුදුසුකම් සහ වෙනත් සුදුසුකම් පිළිබඳ නිර්ණායක;

(ඉ) විධිමත් ලෙස දරනු ලබන සාමාජිකත්ව කාණ්ඩවලින් සාමාජිකයන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම, සාමාජිකත්වයෙන් නෙරපා හැරීම හෝ සාමාජිකත්වයට නැවත ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු යයි සලකනු ලබන වෙනත් සුදුසුකම් පිළිබඳ නිර්ණායක;

(ඊ) ආයතනයේ සාමාජිකයන්ට අදාළ වන්නා වූ වෘත්තීය චර්යා සංග්‍රහය; සහ

(උ) ආයතනයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ ආයතනයේ කටයුතුවල සාමාන්‍ය කළමනාකරණය.

(3) සභාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ රීති, එසේ පළ කිරීමේ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආයතනය, ද ඉන්ස්ටිටියුට් ඔෆ් රියල් එස්ටේට් ඇන්ඩ් වැලුවේෂන්හි අනුප්‍රාප්තිකයා විය යුතු බව

**29.** (1) (මින් මතු "අයි.ආර්.ඊ.වී" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස සංස්ථාපනය කරනු ලැබ ඇති, ද ඉන්ස්ටිටියුට් ඔෆ් රියල් එස්ටේට් ඇන්ඩ් වැලුවේෂන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට බලාත්මක වන පරිදි ගණන් බේරා වසා දැමිය යුතු ය.

(2) සැකය දුරු කිරීම සඳහා, මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආයතනය, සියලු කාර්යය සඳහා, අයි.ආර්.ඊ.වී හි අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලබන අතර, ඒ අනුව -

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ අයි.ආර්.ඊ.වීට අයත් සියලු චංචල සහ නිශ්චල දේපළ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ආයතනය සතු විය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති අයි.ආර්.ඊ.වීහි සියලු ණය සහ බැරකම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ආයතනයේ ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) අයි.ආර්.ඊ.වීහි කාර්ය සඳහා ඇතුළත් වන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලු ගිවිසුම් සහ එකඟතාවයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ආයතනය විසින් ඇතුළත් වන ලද ගිවිසුම් සහ එකඟතාවයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) අයි.ආර්.ඊ.වී විසින් හෝ ඊට එරෙහිව පවරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පැවති සියලු නඩු සහ නීති කෘත්‍ය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ආයතනය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු සහ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඉ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉටු නොවී පැවති අයි.ආර්.ඊ.වී වෙනුවෙන් හෝ ඊට එරෙහිව යම් නිසි අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් ඇතුළත් කරන ලද හෝ සිදු කරන ලද සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට බලපැවැත්වෙන පරිදි මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ආයතනය වෙනුවෙන් හෝ ඊට එරෙහිව ඇතුළත් කරන ලද හෝ සිදු කරන ලද තීන්දු ප්‍රකාශ සහ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

(3) 2007 අංක 07 දරන සමාගම් පනතේ නිශ්චිතව දක්වා ඇති සමාගම් ගණන් බේරා වසා දැමීමට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අයි.ආර්.ර්.වී ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය

**30.** අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ -

"තථ්‍ය දේපළ" යන්නෙන්, ජලය, ගස්, ඛණිජ ද්‍රව්‍ය, ගොඩනැගිලි, නිවාස, වැටකඩුලු සහ පාලම් ඇතුළු ස්වභාවික හෝ මිනිසා විසින් සාදන ලද, ඉඩම් සහ ඉඩම්වලට සම්බන්ධ යම් ස්ථිර වැඩිදියුණු කිරීම් අදහස් වේ; සහ

"තථ්‍ය දේපළ ආයෝජන භාර" යන්නෙන්, මූලික වශයෙන් ආදායම් උපදවන තථ්‍ය දේපළවල ආයෝජනය කරන හෝ ආයෝජනය කිරීමට යෝජනා කරන ඒකක භාර අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**31.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

(5 වන, 6 වන සහ 9 වන වගන්ති)

**ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනයේ විවිධ සාමාජිකත්ව ශ්‍රේණි සඳහා අවශ්‍ය වන්නා වූ සුදුසුකම් සහ පළපුරුද්ද**

**1. සංස්ථාගත සාමාජිකයන්:**

1.1 අධි සාමාජික:

(1) මූලික සුදුසුකම්:

අධි සාමාජික ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා වන සෑම අපේක්ෂකයකුට ම සංස්ථාගත සාමාජිකත්වය සහ මේ පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව තථ්‍ය දේපළ ක්ෂේත්‍රයේ වසර හතක සේවා පළපුරුද්ද තිබිය යුතු ය.

(2) වෙනත් සුදුසුකම්:

(අ) අධි සාමාජික ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම, ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සාමාජිකයන්ගේ අනුමතය හිමි වීමට යටත් විය යුතු ය;

(ආ) අධි සාමාජික ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා වන සෑම අපේක්ෂකයකු ම ආයතනය විසින් වාර්ෂිකව පවත්වනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් (සී.පී.ඩී) අවම වශයෙන් තුනෙන් දෙකකටවත් සහභාගී විය යුතු ය.

1.2 සාමාජික:

(1) මූලික සුදුසුකම්:

සාමාජික ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා වන සෑම අපේක්ෂකයකුට ම ආශ්‍රිත සාමාජිකත්වය සහ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු, මේ පනතේ විධිවිධාන

යටතේ ඇතුළත් කරගත් සහ ලියාපදිංචි කරන ලද සංස්ථාගත සාමාජිකයකුගේ සෘජු අධීක්ෂණය යටතේ ලබා ගත් තථ්‍ය දේපළ ක්ෂේත්‍රයෙහි වසර දෙකක සේවා පළපුරුද්දක් පැවතිය යුතු ය.

(2) වෙනත් සුදුසුකම්:

සාමාජික ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සෑම සාමාජිකයකු ම:

(අ) සංස්ථාගත සාමාජිකත්වය සඳහා ආයතනය විසින් පවත්වනු ලබන විභාගය හෝ වාචික පරීක්ෂණය සමත් විය යුතු ය;

(ආ) ආයතනය විසින් වාර්ෂිකව පවත්වනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් (සී.පී.ඩී) අවම වශයෙන් තුනෙන් දෙකකටවත් සහභාගී විය යුතු ය.

**2. සංස්ථාගත නොවන සාමාජිකයන්:**

2.1 ආශ්‍රිත සාමාජික:

(1) අධ්‍යාපන සුදුසුකම්-

(අ) දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් යම් ඒ හා සමාන උපාධියක් සහ ඒ උපාධිය ලබා ගැනීමෙන් පසුව තථ්‍ය දේපළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් වසරක පළපුරුද්ද: හෝ

(ආ) තථ්‍ය දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් (Masters) සහ ඒ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය (Masters) ලබාගැනීමෙන් පසුව තථ්‍ය දේපළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද සහ ආයතනය විසින් ආශ්‍රිත සාමාජිකයන් සඳහා පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත් විය යුතු ය.

(2) වෙනත් සුදුසුකම්:

මේ ආයතනයේ ශිෂ්‍ය සාමාජිකයකුව සිටීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

2.2 ශිෂ්‍ය සාමාජික:

(1) අධ්‍යාපන සුදුසුකම්:

(අ) දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඒ හා සමාන වෙනත් යම් උපාධියක උපාධි අපේක්ෂකයකු වීම; හෝ

(ආ) තථ්‍ය දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක හෝ පශ්චාත් උපාධියක (Masters) ලියාපදිංචි ශිෂ්‍යයකු වීම;

2.3 ගරු සාමාජික:

(1) ගරු සාමාජිකත්වය ප්‍රදානය කිරීම සඳහා වන මාර්ගෝපදේශ-

(අ) ශ්‍රී ලංකාවේ තථ්‍ය දේපළ කර්මාන්තයට සහ වෘත්තියට කැපී පෙනෙන සේවා දායකත්වයක් ලබා දී ඇති යම් තැනැත්තන්ට ගරු සමාජිකත්වය ප්‍රදානය කළ යුතු ය;

(ආ) ගරු සමාජිකත්වය පුද්ගලයකුට ජීවිත කාලය සඳහා ප්‍රදානය කළ යුතු අතර 5 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රදානය කළ යුතු ය;

(ඇ) ගරු සාමාජිකයින්, ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමක දී පැමිණ සිටින මුළු සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් තෝරා පත් කර ගත යුතු ය;

(ඈ) ගරු සාමාජිකත්වය සඳහා නාමිකයන් තෝරා ගැනීමේ පටිපාටිය, තථ්‍ය දේපළ ක්ෂේත්‍රය සඳහා කරන ලද කැපී පෙනෙන දායකත්වය පිරික්සීම මගින් සාමාජික කමිටුව විසින් ද, ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සලකා බැලීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු සභාව විසින් ද සිදු කළ යුතු ය;

(ඉ) ඔහුගේ තනතුර, පළපුරුද්ද හෝ විශිෂ්ටත්වය හේතුවෙන් අනාගතයේ දී ආයතනයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේදී සහාය දීම සඳහා ඇති කුසලතාවය සහ හැකියාව;

(ඊ) සභාව විසින්, යම් තැනැත්තකු ගරු සාමාජිකත්වයට නම් කිරීම සහ එය ප්‍රදානය කිරීම පිළිබඳ යම් වාර්තා සභාවේ අනාගත යොමුව සඳහා සාක්ෂියක් ලෙස ආරක්ෂිතව තබා ගත යුතු ය;

(2) තෝරා ගැනීමේ නිර්ණායක:

සභාව විසින්, ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී එහි නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙරාතුව පහත දැක්වෙන අංශ පරීක්ෂා කළ යුතු ය:-

(අ) ශ්‍රී ලංකාවේ තථ්‍ය දේපළ කර්මාන්තයේ සහ වෘත්තියේ අවම වශයෙන් වසර පහළොවක සේවාව;

(ආ) තථ්‍ය දේපළ කර්මාන්තයේ සහ වෘත්තියේ උන්නතිය වෙනුවෙන් නාමිකයාගෙන් ලැබී ඇති කැපී පෙනෙන දායකත්වය සහ ආයතනය හෝ ශ්‍රී ලංකාව ඔසවා තැබීමට දක්වා ඇති නොමසුරු දායකත්වය;

(ඇ) තථ්‍ය දේපළ කර්මාන්තයට සහ වෘත්තියට දායකත්වය ලබා දෙමින් දේශීය හෝ ජාත්‍යන්තර ආයතනවල සේවය කිරීමෙන් හෝ පෞද්ගලික වෘත්තිකයකු ලෙස ඔහු දරන ලද තනතුරු සහ සේවය කළ වසර ගණන;

(ඈ) තථ්‍ය දේපළ කර්මාන්තයට හෝ ආයතනයට හෝ වෘත්තියට සිදු කරන ලද විශේෂිත වූ සේවය සහ එම අතිවිශේෂ සේවය පිළිබඳ ප්‍රදර්ශනාත්මක බලපෑම.

(3) කාර්යපටිපාටිය:

(අ) ආයතනය විසින්, ගරු සාමාජිකත්වය පිළිබඳව උනන්දුවක් ඇති යම් පාර්ශ්වයකගෙන් හෝ විද්‍යුත් මාධ්‍ය මගින්, ගරු සාමාජිකත්වය සඳහා

වන අයදුම්පත්, පළපුරුද්ද, දායකත්වය සහ උනන්දුව පිළිබඳ විස්තර සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් කරන ලද අවශ්‍ය සහතික කිරීම් සමඟ සහ සංස්ථාගත සාමාජිකයකු මගින් වූ යෝජනාවක් සහ සභාවේ අධි සාමාජිකයකුගේ ස්ථිර කිරීමක් සමඟ කැඳවනු ලැබිය යුතු ය;

(ආ) මූලික පියවර වශයෙන්, යම් තැනැත්තකුට ගරු සාමාජිකත්වය ප්‍රදානය කිරීම සඳහා වන නාමයෝජනා, ආයතනයේ සභාව විසින් ගැඹුරු ලෙස සලකා බැලිය යුතු අතර එවැනි නිර්දේශයක් ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කිරීම පිණිස සභාවේ සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් අනුමත කළ යුතු ය;

(ඇ) ඉන් පසුව, යෝජනා කරන්නා විසින්, ගරු සාමාජිකත්වය සඳහා නිර්දේශිත නම්, ආයතනයේ සමස්ත සාමාජිකයන් විසින් සලකා බැලීම සඳහා සහ අනුමත කරනු ලැබීම සඳහා වාර්ෂික මහා සභා රැස්වීමක දී ඉදිරිපත් කළ යුතු අතර, එහි දී පැමිණ සිටින මුළු සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් ඊට පක්ෂ විය යුතු ය;

(ඈ) සෑම නාමයෝජනාවක් ම, තථ්‍ය දේපළ කර්මාන්තයට, වෘත්තියට, ආයතනයට හෝ ශ්‍රී ලංකාවට කරන ලද සේවාවන් සහ දායකත්වය පිළිබඳ විස්තරයක් ද සහිතව විය යුතු ය;

(ඉ) මුල් වසර තුනේ දී ගරු සාමාජික සංඛ්‍යාව උපරිම වශයෙන් පහකට සීමා විය යුතු අතර ඉන් පසුව වසරකට පුද්ගලයන් දෙදෙනකු බැගින් විය යුතු ය;

(ඊ) ආයතනය විසින් ඔවුන්ව පිළිගැනීමේ සහ ප්‍රසිද්ධ කිරීමේ කාර්යය උදෙසා, ආයතනයේ ගරු සාමාජිකත්වය ලබා ගැනීමට කැමැත්ත පළ කරන ශ්‍රී ලංකාවේ පිළිගත් තථ්‍ය දේපළ සංවර්ධකයන්ට හෝ ආයෝජකයන්ට ගරු සාමාජිකත්වය ලබා

ගැනීමට අවසර දිය යුතු යයි යෝජනා කරනු ලබන අවස්ථාවක දී, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි වාර්ෂික හෝ යාවජීව ගාස්තුවකට යටත්ව, ඒ සාමාජිකත්වය ප්‍රදානය කරනු ලැබිය හැකි ය;

(උ) ගරු සාමාජිකයකු, ආයතනයේ සංස්ථාගත සාමාජිකයින්ගේ කාණ්ඩය යටතට නොගැනෙන බැවින් ආයතනය විසින් ගරු සාමාජිකයින්ට වෘත්තීමය කටයුතුවල නියැලීමට හෝ ඡන්දය දීමේ බලතලවලට සම්බන්ධ වීමට අවසර දීම හෝ බලය ලබා දීම නොකළ යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.